දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112694033, 0112675280
Telephone ) 0112675449

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax ) 0112692913

විද්‍යුත් තැපැල ) postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය ) NA/14/03/2023
எனது இல )
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. )

දිනය )
திகதி ) 2025.11. 21
Date )

# සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
## சுகாதார மற்றும் வெகுஜன ஊடக அமைச்சு
## Ministry of Health & Mass Media

පොදු චක්‍රලේඛ ලිපි අංක - 01 - 45/2025

ශ්‍රී ලංකා ජාතික රෝහලේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්,
අධ්‍යක්ෂ, ජාතික රෝහල මහනුවර / ගාල්ල
රේඛීය අමාත්‍යාංශය යටතේ පාලනය වන සියලුම ශික්ෂණ රෝහල් /
මහ රෝහල් / මූලික රෝහල් හා විශේෂිත ආයතන ප්‍රධානීන් ඇතුලු
රේඛීය අමාත්‍යාංශය යටතේ පාලනය වන සියලුම ආයතන ප්‍රධානීන් වෙත.

**සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (හෙද මහජන සෞඛ්‍ය) තනතුරට අයදුම්පත් කැඳවීම.**

සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (හෙද මහජන සෞඛ්‍ය) තනතුරට රේඛීය අමාත්‍යාංශය යටතේ පාලනය වන රෝහල් / ආයතනවල සේවය කරන 2025.12.15 දිනට පෙර පහත 04 ජේදයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. වැටුප් ක්‍රමය - මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10-2025 හි SL- 01/2025 ට අදාළ උපලේඛන II හි සඳහන් SL-01-2025 වැටුප් පරිමාණයේ III ශ්‍රේණියට අදාළ 82,150 – 16 x 2400 = 120,550/- ක (මාසික) වැටුප් පරිමාණය හිමි අතර, ඔබට වැටුප් ගෙවනු ලබන්නේ අදාළ චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන අනුවය.

03.සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි - මෙම තනතුර ස්ථිරය.විශ්‍රාම වැටුප් සහිතය.වැන්දඹු අනත්දරු / වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

04. අවශ්‍ය සුදුසුකම් -

I. විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරී (මහජන සෞඛ්‍ය) තනතුරක සිටින නිලධාරියෙක් විය යුතු අතර අදාළ තනතුරේ යටත් පිරිසෙන් වසර 05ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් තිබීම.

II. අදාළ කාලය තුළ නියමිත වැටුප් වර්ධක සියල්ලම උපයාගෙන තිබීම හා පූර්වාසන්නතම වසර පහ (05) තුළ සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

III. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01-2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

IV. අනුමත කාර්යසාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස්වීම් දිනට පෙරාතුව වසර පහක් (05) තුළ සතුටුදායක මට්ටමට වඩා ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

05. තෝරා ගන්නා ක්‍රමය -

ඉහත 04 හි සුදුසුකම් සහිත නිලධරයන් අතුරින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වා සුදුසුකම් ලබන නිලධාරියා තෝරා ගනු ලැබේ. අයදුම්කරුවන් විසින් අදාළ සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය වන 2025.12.15 දිනට පෙර සම්පූර්ණ කර තිබිය යුතුය.

06. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු පරිපාටිය පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| I. | විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරී (මහජන සෞඛ්‍ය) තනතුරේ සේවා කාලයට | උපරිම ලකුණු 30 |
| | ජ්‍යෙෂ්ඨතාවය සඳහා ලකුණු ලබා දීම රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2019 හා 01/2019 (1) අනුව සිදු කෙරේ. | |
| II. | හෙද සේවයේ 1 වන ශ්‍රේණියේ / අධි ශ්‍රේණියේ හෙද නිලධාරී (මහජන සෞඛ්‍ය) තනතුරේ සේවා කාලයට | උපරිම ලකුණු 30 |
| | 1 වන ශ්‍රේණියේ / අධි ශ්‍රේණියේ හෙද නිලධාරී (මහජන සෞඛ්‍ය) තනතුරේ සක්‍රිය සතුටුදායක සේවා කාලය සඳහා වසරකට | ලකුණු 03 |
| | මාස 06 කට | ලකුණු 02 |
| | මාස 03 කට | ලකුණු 01 |
| | සටහන - ඉහත අංක 04 යටතේ මූලික සුදුසුකම් ලෙස සළකා බලන සේවා කාලය සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ. | |
| III. | ක්ෂේත්‍රයට අදාළ අධ්‍යාපන සුදුසුකම් (සනාථ කිරීම සඳහා සහතික පත්‍ර මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු ය) | උපරිම ලකුණු 25 |
| | අ - හෙද ක්ෂේත්‍රයට ඍජුවම අදාළ වන අධ්‍යාපන සුදුසුකම් සඳහා | උපරිම ලකුණු 13 |
| | 01 - පශ්චාත් උපාධිය (හෙද මහජන සෞඛ්‍ය) | ලකුණු 13 |
| | 02 - පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් | ලකුණු 11 |
| | 03 - මූලික උපාධියක් සඳහා | ලකුණු 08 |
| | 04 - ඩිප්ලෝමා පාඨමාලාවක් (මාස 06 කට හෝ පැය 720 ට නොඅඩු පශ්චාත් ප්‍රාථමික හෙද පුහුණු ඩිප්ලෝමාව හැර) | ලකුණු 06 |
| | සටහන -<br>1. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක : 01/2025 හි විධිවිධාන ප්‍රකාරව නිලධාරියා විසින් අදාළ උපාධි සුදුසුකම්වල සත්‍යතාවය පිළිබඳව අදාළ විශ්ව විද්‍යාලයෙන් සත්‍යාපනය කරගත යුතු වේ.<br>2. උක්ත අංක 01, 02 හා 03 යටතේ සඳහන් සුදුසුකම් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් දේශීය / විදේශීය අධ්‍යාපන ආයතනයක් මගින් ලබා ගත් සුදුසුකම් විය යුතු ය. අංක 04 යටතේ සඳහන් සුදුසුකම් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව / අධ්‍යාපන / සෞඛ්‍ය අමාත්‍යාංශය අනුමත අධ්‍යාපන ආයතනයක් මගින් ලබා ගත් සුදුසුකම් විය යුතුය.<br>ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. | |
| | ආ - වෙනත් අධ්‍යාපන සුදුසුකම් සඳහා | උපරිම ලකුණු 12 |
| | 01 - තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ ඩිප්ලෝමා | ලකුණු 04 |
| | 02 - දෙවන භාෂාව / සන්ධාන භාෂාව පිළිබඳ ඩිප්ලෝමා | ලකුණු 04 |
| | 03 - කළමනාකරණ ක්ෂේත්‍රයට අදාළ ඩිප්ලෝමා | ලකුණු 04 |
| | සටහන - ඉහත (ආ) යටතේ සුදුසුකම් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව / අධ්‍යාපන / සෞඛ්‍ය අමාත්‍යාංශය අනුමත ආයතනයක් මගින් රජයේ පිළිගත් ලබාගත් කාලය මාස 06 කට හෝ පැය 720 කට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් විය යුතුය. ඉහත එක් එක් ක්ෂේත්‍රයට අදාළව ලබාගෙන ඇති ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. | |
| IV. | ක්ෂේත්‍රයට අදාළ වෙනත් බාහිර ක්‍රියාකාරකම් සඳහා | උපරිම ලකුණු 10 |
| | 01 - විෂයානුබද්ධ පර්යේෂණ, නිබන්ධන, ප්‍රකාශන හා පුවත්පත් සඟරා ආදියට සපයන ලද ලිපි | ලකුණු 02 |
| | 02 - පුහුණු වැඩසටහන් මෙහෙයවීම / සම්බන්ධීකරණය | ලකුණු 02 |
| | 03 - පුහුණු වැඩමුළු / සම්මන්ත්‍රණ (දේශීය / විදේශීය) සඳහා සහභාගි වීම | ලකුණු 02 |
| | 04 - ප්‍රශංසා (පොදු 230 B ආකෘතිය අනුව වන ප්‍රශංසා සඳහා පමණක්) | ලකුණු 02 |
| | 05 - සුවිශේෂී සේවා සැපයීම - ස්වාභාවික /හදිසි /වසංගත /ත්‍රස්ත විපත් තත්ත්වයන් | ලකුණු 02 |
| | සටහන -<br>එක් සහතිකයකට /ලිපියකට /ප්‍රශංසාවකට ලකුණු 01 බැගින් එක් නිර්ණායකයට උපරිම ලකුණු 02 බැගින් වන පරිදි විය යුතු අතර සියලු සුදුසුකම් අදාළ පරිදි සහතික සහ ලිපි ලේඛන මගින් තහවුරු කළ යුතු ය. | |
| V. | සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | උපරිම ලකුණු 05 |
| | (කුසලතාව, නායකත්වය, ආකල්ප, පෞර්ෂත්වය හා සන්නිවේදන කුසලතා සඳහා) | |
| | එකතුව | 100 |

07. අයදුම්පත ඉදිරිපත් කළ යුතු පිළිවෙල -

මේ සමග අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුව පිළියෙල කර ගත් ඉල්ලුම්පත් අදාළ ආයතන ප්‍රධානියා මගින් 2025.12.19 දින හෝ ඊට පෙර පහත ලිපිනයට ලැබෙන සේ එවිය යුතුය.

අධ්‍යක්ෂ (පාලන) I
"සුවසිරිපාය"
අංක 385
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
කොළඹ 10

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවේ නියමය පරිදි.

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
ලේකම්
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
ලේකම්
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

# ආදර්ශ අයදුම්පත්‍රය

**සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (හෙද මහජන සෞඛ්‍ය) තනතුරට බඳවා ගැනීම**

01. I මුලකුරු සමඟ නම :......................................................................................................

(පැහැදිලි අකුරින්)

II අනෙකුත් නම් සම්පූර්ණයෙන් :.......................................................................................

02. ලිපිනය:

I කාර්යාලීය :..............................................................................................................

II පෞද්ගලික :..............................................................................................................

03. දුරකථන අංකය

I පෞද්ගලික :..............................................................................................................

II රාජකාරී : ..............................................................................................................

04. ජාතික හැඳුනුම්පත් අංකය : .......................................................................................

05. උපන් දිනය : .................................................

2025.12.15 දිනට වයස අවු : .................. මාස :............ දින :......................

06. I). සිසු හෙදියක් ලෙස පුහුණුව ඇරඹූ දිනය : ..................................................

II). හෙද සේවයේ 111 ශ්‍රේණියට පත් වූ දිනය :....................................

III). හෙද සේවයේ 11 ශ්‍රේණියට පත් වූ දිනය :....................................

IV). හෙද සේවයේ 1 වන ශ්‍රේණියේ / අධි ශ්‍රේණියේ හෙද නිලධාරිනී (මහජන සෞඛ්‍ය) ලෙස උසස් වූ දිනය : ..............................

V). හෙද සේවයේ විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරිනියක් ලෙස උසස්වූ දිනය : ..........................

(විශේෂ ශ්‍රේණියට උසස්වූ ලිපියේ පිටපතක් අමුණන්න)

VI). සේවයේ කඩවීමක් ඇත්ද : ........................................................................

VII). එසේ නම් නැවත සේවයේ පිහිටුවන ලද දිනය : ..................................................

VIII). මහජන සෞඛ්‍ය හෙද පාලනය පිළිබඳ සේවා කාලය : ..............................................

07. ඉහළම අධ්‍යාපන සුදුසුකම : ...................................................................................

08. වෙනත් විශේෂ සුදුසුකම් : ..........................................................................................

..................................................................................................................................

ඉහත තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මා විසින් ඉහත සපයන ලද තොරතුරු වලින් යමක් අසත්‍ය හෝ සාවද්‍ය බව, මා තෝරා ගැනීමට පෙර හෝ පසු හෝ අනාවරණය වුවහොත් මා විනයානුකූල ක්‍රියාමාර්ගයට යටත් වන බවත් දනිමි.

................................ ...........................

දිනය අත්සන

09. විෂය භාර කළමනාකරණ සහකාර නිලධාරි විසින් පෞද්ගලික ලිපි ගොනුව අනුව සම්පූර්ණ කළ යුතුය.

1) පසුගිය අවුරුද්ද තුළ ලබා ඇති නිවාඩු පිළිබඳ විස්තර : ......................................
......................................................................................................

II) නිලධාරියා / නිලධාරිනිය වැටුප් රහිත නිවාඩු ලබා තිබේ ද යන වග:
(වැටුප් රහිත නිවාඩු ලබා ඇති කාල සීමාව සඳහන් කරන්න)
a) ප්‍රසූත නිවාඩුවලට අදාළ වැටුප් රහිත නිවාඩු :.....................................................
b) අනෙකුත් වැටුප් රහිත නිවාඩු :..............................................................

III) නිලධාරියා / නිලධාරිනියට විරුද්ධව විනය පරීක්ෂණ කිසිවක් ඇත්ද යන වග : ......................
(එසේ තිබේනම් අදාළ ලිපියේ පිටපතක් ඇමිණිය යුතුය)

IV) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට ආසන්නතම අවුරුදු 05 තුළ වාර්ෂික වැටුප් වර්ධක උපයාගෙන තිබේද?
2020 - ...................................... 2023 - ..........................................
2021 - ...................................... 2024 - ..........................................
2022 - ...................................... 2025 - ..........................................

V) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට ආසන්නම අවුරුදු 05 තුළ කාර්ය සාධන මට්ටම?
2020 - ...................................... 2023 - ..........................................
2021 - ...................................... 2024 - ..........................................
2022 - ...................................... 2025 - ..........................................

(ඉතා හොඳයි /හොඳයි /සතුටුදායකයි ලෙස සටහන් කරන්න ; එසේම අදාළ කර ගත් කාර්ය සාධන වාර්තාවල පිටපත් අමුණන්න.)

VI) වෙනත් කරුණු - ......................................................................................
......................................................................................................

............................................ මයා/මිය/මෙනවියගේ පෞද්ගලික ලිපි ගොනුව අනුව සඳහන් තොරතුරු හා අංක 01 සිට 08 දක්වා අයදුම්කරු විසින් දක්වා ඇති සියලු තොරතුරු නිවැරදි බව මෙයින් සහතික කරමි. අංක 09 යටතේ මා විසින් සපයන ලද තොරතුරු ද නිවැරදි බව සහතික කරමි.

................................ ..............................................
දිනය විෂයභාර නිලධාරියා / නිලධාරිනියගේ අත්සන

10. පරිපාලන නිලධාරි / රෝහල් ලේකම් ගේ නිර්දේශය

............................................................................ මිය/මයා/මෙනවියගේ පෞද්ගලික ලිපි ගොනුව අනුව ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවට මෙයින් සහතික කරමි.

................................ ..............................................
දිනය පරිපාලන නිලධාරිගේ/රෝහල් ලේකම්ගේ අත්සන හා නිලමුද්‍රව

11. ආයතන ප්‍රධානියාගේ නිර්දේශය :

1. වැඩ හා හැසිරීම - ..................................
2. සාමාන්‍ය කාර්යක්ෂමතාවය - ..................................

...................................................................................................................මිය/මයා/මෙනවියගේ පෞද්ගලික ලිපි ගොනුව අනුව අයදුම්පතේ සඳහන් තොරතුරු සත්‍ය බවත් නිලධාරිනිය සේවයේ ස්ථිර කර ඇති බවත් .......................................... දින සිට විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරිනී (මහජන සෞඛ්‍ය) ලෙස සේවය කරන බවත් සහතික කරමි.

අයදුම්පත නිර්දේශ කරමි / නොකරමි.

.................................... ..........................................
දිනය ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිලමුද්‍රාව